# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1180/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 17/07/2024<br>පැය 1450 |

## මාධ්‍ය නිවේදනය

**දරුවෙකුට පහරදී කෲරත්වයට පත්කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් සැකකාරියන් සිව්දෙනෙකු අත්අඩංගුවට ගැනීම - අරණායක පොලිස් ස්ථානය.**

සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන දරුවෙකුට පහරදීමේ වීඩියෝ දර්ශනයකට අදාලව අරණායක පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කරන ලදි. ඒ අනුව දරුවාට පහරදීම සම්බන්ධයෙන් දරුවාගේ මිත්තණියන් දෙදෙනෙකු සහ පහරදීමට අනුබල දීම සම්බන්ධයෙන් දරුවාගේ මව සහ තවත් මිත්තණිය අරණායක පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් වයස අවුරුදු 42ත් 78ත් අතර වයස් වල පසුවන අරණායක ප්‍රදේශයේ පදිංචිකාරියන් වේ.**

සැකකාරියන් 2024.07.17 වන අද දින මාවනැල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත අතර පහරකෑමට ලක්වූ දරුවා පියා භාරයේ මාවනැල්ල අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

සිදුවීම සම්බන්ධව අරණායක පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**